SLGURU.LK

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2017
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 10 | විෂයය / பாடம் / Subject: ඉස්ලාම් ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper: I | කාලය / காலம் / Time: පැය 01 |

.....

අවධානය යොමු කළ යුතු කරුණු

- සියලුම ප්‍රශ්නවලට ඔබට ලබා දී ඇති පිළිතුරු අතරින් ඉතාම නිවැරදි පිළිතුරු අංකය මත `x' සලකුණු කරන්න.

.....

01. කලා කද්ර් පිළිබඳ විශ්වාසය ද එයට සම්බන්ධ සියලුම කරුණු ද අන්තර්ගත කොටස වන්නේ,

1. අස්සමියියාත් 2. අර්රුහානියියත් 3. අන්නුබූවත් 4. අල් ඉලාහියියාත්

02. උපවාසයේ නියැලීමට හරාම් වන දින,

1. අවුරුදු දින 2. අයියාමුන් තෂ්රීක් 3. දුල්හජ් 11,12,13 4. සියල්ල නිවැරදි

03. දුල්හජ් 13, 14, 15 යන දින අන්තර්ගත වන්නේ,

1. අයියාමුත් තෂ්රීක් 2. අයියාමුල් බීල් 3. අයියාමුස් සුද් 4. අයියාමුල් ඊද්

04. ෆර්ලූ සලාතයට පසු මෙය පාරායනය කිරීමෙන් අනෙක් සලාතය දක්වා අල්ලාහ්ගේ රැකවරණයේ සිටියි. එය

1. කුල් සූරා 2. සූරතුල් මුආවිවදෙන් 3. ආයතුල් කුර්ස් 4. සුබ්හානල්ලාහ් 33

05. ප්‍රාණය ඇති සතෙකුගේ ශරීරයෙන් වෙන් වූ ශරීර කොටස්,

1. නජිස් වේ 2. නජිස් නොවේ 3. සුලු නජිස් වේ 4. දැඩි නජිස් වේ

06. පැරණී අරාබිකරයේ ගෝත්‍ර නායකයා "ෂෙක්" යනුවෙන් හඳුන්වනු ලැබූ සේම "ගෝත්‍ර" හඳුන්වනු ලැබුවේ,

1. අසබියියා 2. කබීලා 3. ෂුඌබ් 4. නායික්

07. ජිබ්රිල් (අලෙ) තුමා අල්කුර්ආනය පාරායනය කරන විට නබි (සල්) තුමා එහි නිවැරදිභාවය පරීක්ෂා කළ අවස්ථාවන්,

1. හතරකි 2. තුනකි 3. දෙකකි 4. එක් වරකි

08. උස්මාන් (රළි) තුමාගේ කාලයේ දී ප්‍රදේශ දෙකක ජනතාව අල් කුර්ආනය විවිධාකාරයෙන් පාරායනය කළ බැවින් අල් කුර්ආනය පිටපත් කිරීමේ සේවයේ අවශ්‍යතාවය අවධාරණය කරනු ලැබුණි. එම ප්‍රදේශ වන්නේ,

1. මක්කා - මදීනා 2. ෂාම්-ඉරාක් 3. ඉරාක්-සිරියා 4. ෂාම්-ඩමස්කස්

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

09. ආදේශ කරන්නා "මුෂ්රික්" ලෙස හඳුන්වන අතර ව්‍යාජ නබිවරු,

1. මුර්තද් 2. මුතනබ්බි 3. මුනාෆික් 4. මුකල්ලිද්

10. ජාහිලියියා කාලයේ උසස් ගෝත්‍රවල ජාතික මට්ටමින් සිදු වූ විවාහ ක්‍රමය හඳුන්වන්නේ,

1. නිකාහ් සාහිහ් 2. නිකාහ් ෂරීක් 3. නිකාහ් මුත්ආ 4. නිකාහ් ෂරීහ්

11. අල්ලාහ් රබ්බුල් ආලමීන් (ලෝ වැසියන්ගේ දෙවිදුන්) ලෙස සිටින අතර නබි (සල්) තුමා ලෝ වැසියන්ගේ දායාදය ලෙස සිටියි යන්න අරාබි පදය වන්නේ,

1. කාෆතන් ලින්නාස් 2. රහ්මතන් ලිල් ආලමීන්

3. උස්වදුන් හසනාත් 4. අහ්සනුල් කුලූක්

12. "වසතියියා" යන්නෙන් අප වටහා ගනු ලබන්නේ,

1. ත්‍රස්තවාදය 2. මධ්‍යස්ථභාවය ඇතිකර ගැනීම

3. ත්‍රස්තවාදය තුළ මධ්‍යස්ථව ක්‍රියා කිරීම 4. දැඩි අවධානයකින් යුතුව ඉටු කිරීම

13. නබි (සල්) තුමාට නුබූවත් ලැබූ විට එය ප්‍රථම වරට එතුමා "නබිවරයෙකු" යැයි ස්ථිර කරනු ලැබුවේ,

1. කදීජා (රළි) තුමිය 2. අබූබකර් (රළි) තුමා

3. අබූතාලිෆ් 4. වරකා බින් නවිෆල්

14. පතිවත රැක ගැනීමේ අවශ්‍යතාවය මිනිසාට පහදා දීමට නබිවරයෙකු පතිවත රැක ගත් ආකාරය අල්ලාහ් අල්කුර්ආනයේ පවසා ඇත. එම සූරාව වන්නේ,

1. මර්යම් 2. කහ්ෆ් 3. යූනුස් 4. යූසුෆ්

15. විනිශ්චයකරුවන් තෙවර්ගය අතරින් දෙවර්ගයක් නිරයේ සිටින අතර අනෙක් වර්ගය ස්වර්ගයේ සිටිති. නිරයේ සිටින්නන් වන්නේ,

1. දැනුම නොමැතිව තින්දු ලබා දුන් පිරිස 2. සත්‍ය නොදැන තින්දු ලබා දුන් පිරිස

3. තික්ෂණ බුද්ධියෙන් තින්දු ලබා දුන් පිරිස 4. විමර්ශනයකින් තොරව තින්දු ලබා දුන් පිරිස

16. ව්‍යාපාර සම්බන්ධ නීතිරීති පිළිබඳ දැනුම නොමැති වුවන් වෙළඳ පොළෙහි ව්‍යාපාර නොකළ යුතුය. මන්දයත් එවැන්නන් කැමැත්තෙන් හෝ අකැමැත්තෙන් පොළිය අනුභව කළ හැකිය යැයි අවවාද කරනු ලැබුවේ,

1. අබූබකර් (රළි) තුමා 2. උමර් (රළි) තුමා

3. අබූහනීෆා (රහ්) තුමා 4. උමර් බින් අබ්දුල් අසිස්

17. යකඩ භාවිතා කොට විශාල බිත්ති හා අමුණු නිර්මාණය කරන තාක්ෂණය ලබා සිටියේ,

1. සකරියියා (අලෙ) තුමා 2. දාවූද් (අලෙ) තුමා

3. දුල්කර්නෙන් 4. ඉද්රීස් (අලෙ) තුමා

18. කඃබාව සත් වරක් තවාෆ් කළ යුතුය යැයි අපට ඉගැන්වූ මූලාශ්‍රය වන්නේ,

1. අල් කුර්ආන් 2. සුන්නාහ් 3. ඉජ්මා 4. කියාස්

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

19. "අල්ලාහුම්ම අඉන්නි අලා දික්රික, වෂුක්රික, වහුස්නි ඉබාදතික" යැයි දුආව පාරායනය කිරීම සුන්නත් කරනු ලැබූ සලාතය වන්නේ,

1. සෑම සලාතයකට ම පසුව
2. සුබ්හ් සලාතයට පසුව
3. සුබ්හ්-මග්රිබ් සලාතයන්ට පසුව
4. ඉෂා සලාතයට පසුව

20. නීති ක්ෂේත්‍රය තුළ පැන නගින ප්‍රශ්නවලට තීන්දු ලබා දීම තුළින් ඉස්ලාම් සෑම කාලයකට ම සුදුසුය, යන්න ස්ථිර කරනු ලබන්නේ,

1. සුන්නාහ්
2. ඉජ්මා
3. කියාස්
4. සහය මූලාශ්‍රය

21. මෙලොව ඇල්මක් නොමැතිව සිටින්න. අල්ලාහ් ඔබව ප්‍රිය කරයි. මිනිසා සතු වස්තුවෙහි අවශ්‍යතා රහිතයෙකු ලෙස සිටින්න. මිනිසා ඔබව ප්‍රිය කරයි, යැයි නබි (සල්) තුමා පහදා දෙනු ලැබුවේ,

1. ඉහ්ලාස්
2. වරළ
3. සුහුද්
4. වරළ-සුහුද්

22. ලොවේ පරමාධිපතිව මම පාරිශුද්ධ කරමින් ඔහුට ප්‍රශංසා කරන්නෙමි" යන අර්ථය සහිත සලාතය සමග සබැඳි වචන පෙළ වන්නේ,

1. සුබ්හාන රබ්බියල් අලිමි වබිහම්දිහි
2. සුබ්හාන රබ්බියල් ඇලා වබිහම්දිහි
3. සමියල්ලාහු ලිමන් හමීදා
4. රබ්බනා ලකල් හම්දු මිල්අස්සමාවාති වමිල් අල් අර්ලි

23. "මුහාෆලතුස් සලාහ්" යන්නෙන් ඔබ වටහා ගන්නේ,

1. සලාතය ඉටු කිරීම
2. සලාතයේ පිළිවෙත් සුරැකීම
3. සලාතය ව්‍යාප්ත කිරීම
4. සලවාත් ක්‍රමානුකූලව පැවසීම

24. ගැත්තෙකු සලාතයේදී "අල්හම්දුලිල්ලාහි රබ්බිල් ආලමීන්" යැයි පැවසූ විට අල්ලාහ්ගේ පිළිතුර වන්නේ,

1. මගේ ගැත්තා මාව පාරිශුද්ධ කළේය
2. මගේ ගැත්තා මාව සතුටට පත් කළේය
3. මගේ ගැත්තා මාව ප්‍රශංසා කළේය
4. මගේ ගැත්තා මාව උසස් කළේය

25. සූරතුල් ෆලක්. සූරතුන් නාස් යන සූරා දෙකෙහිම වාක්‍ය ගණනය වන්නේ,

1. නවයකි
2. දහයකි
3. එකොළහකි
4. දොළහකි

26. හාෂිම්වරු, මුත්තලිෆ්වරු අන්තර්ගත වන්නේ,

1. අහ්ලුල් කිතාබ්
2. අහ්ලුල් කුරෙරෂ්
3. අහ්ලුල් බෙත්
4. අහ්ලුල් මක්කා

27. කුරෙෂි කාෆිර්වරු විසින් නබි (සල්) තුමාව හා එතුමාගේ සහයකයින්ව ආහාර පාන නොදී සිර කර තබා තිබූ කාලය වන්නේ,

1. වසර තුනකි
2. වසර දෙකකි
3. වසරකි
4. මාස හයකි

28. දෙවන අකබා ගිවිසුම සිදු වූ වසර වන්නේ,

1. නුබුවත් 05
2. නුබුවත් 09
3. නුබුවත් 11
4. නුබුවත් 12

29. නබි (සල්) තුමාගේ සිරාව ප්‍රථම වරට හිජ්රි 151දී ලියන ලද්දේ,

1. මුහම්මද් හිෂාම්
2. මුහම්මද් අල් ගස්සාලි
3. මුහම්මද් බින් ඉස්හාක්
4. අබ්දුල් මලික් බින් ඉෂාම්

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

30. සලාතයේදී පාරායනය කරන අල් කුර්ආන් වැකිවලට බොහෝ කුසල් හිමි වුවද පහසුව තකා සුළු ප්‍රමාණයක් පාරායනය කිරීමට අනුමැතිය අල් කුර්ආන් ලබා දී ඇත. මක්නිසාදයත්,

1. ඔබලා අතර කිහිපදෙනෙකු රෝගීන්ව සිටිය හැකිය.
2. කිහිපදෙනෙකු අල්ලාහ්ගේ දායාද සොයා ඉපයීමට යා යුතුව ඇත.
3. කිහිපදෙනෙකු ජිහාද් කිරීමට යා යුතුව ඇත.
4. කිහිපදෙනෙකු පාරායනය කිරීමට නොහැකිව සිටිය හැකිය, මෙම වැකි අතරින් ඉතාම නිවැරදි වන්නේ,

1. ප්‍රථම වැකිය
2. දෙවන හා තෙවන වැකිය
3. ප්‍රථම, දෙවන හා තෙවන වැකි
4. සියල්ලම නිවැරදිය

31-32 ප්‍රශ්නවලදී "අ" තීරුව "ආ" තීරුවට ගළපා නිවැරදි පිළිතුර සොයන්න.

| "ආ" | "ආ" |
|---|---|
| 1. කුර්ආනය මිහිරිව පාරායනය කිරීම | a තර්තිබුන් නුසුල් |
| 2. වහි සටහන් කරන්නන් | b බෙතුල් ඉස්සා |
| 3. කුර්ආනය පහළ වූ පිළිවෙළ | C කුර්රා |
| 4. කුර්ආනය සම්පූර්ණයෙන් පහළ කළ තැබූ ස්ථානය | D කුත්බුල් වහි |

1.BDCA 2. CDAB 3. DABC 4. ACDB

32.

| "අ" | "ආ" |
|---|---|
| 1. ගෝත්‍ර හැඟීම | A මුත්ආ |
| 2. තාවකාලික විවාහය | B. තස්කියා |
| 3. විත්ත පාරිශුද්ධිය | C අසබියියා |
| 4. රහසිගත ස්ථානය | D වහි |

1. ACDB 2. BCAD 3. CABD 4. BCAD

33. දැඩි නියඟයක් හා හිඟයක් පවතින අවස්ථාවක හිරකියුලියස් රජුට විරුද්ධව නොවැළැක්විය හැකි තත්වයක් මත සටන් කිරීම උදෙසා උස්මාන් (රලි) තුමා තම වස්තුව විශාල වශයෙන් පරිත්‍යාගය කළේය. එම ප්‍රමාණය වන්නේ,

1. දිර්හම් 3000 2. දිර්හම් 5000ක් 3. දිර්හම් 7000ක් 4. දිර්හම් 10,000ක්

34. අප දිනපතා සුබිහ් සලාතයෙන් පසුව උසුරිය යුතු දුආ අතරින් එකකි,

1. අල්ලාහුම්ම අපිර්නි මිනන් නාර්
2. කලිමා තවිහිද්
3. අල්ලාහුම්ම අන්තස් සලාමි වමින්කස් සලාමි තබා රක්ත
4. අල්ලාහුම්ම ඉන්නි අස්අලුක ඉල්මන් නාෆිආ වරිස්කන් තයියිබා වඅමලන් මුතකබ්බලා

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

35. දැඩි නපීස් තැවරුණු ස්ථානයෙහි නපීසයේ ගුණාංග තුනම දක්නට නොලැබෙන විටකදී,

1. වරක් ජලය ගලා යෑමට සලස්වා සෝදා හැරීම ප්‍රමාණවත්ය.
2. තෙවරක් ජලය ගලා යෑමට සලස්වා සෝදා හැරීම ප්‍රමාණවත්ය.
3. සත් වරක් ජලය ගලා යෑමට සලස්වා සෝදා හැරීම ප්‍රමාණවත්ය.
4. පස් මිශ්‍ර ජලය සමග හත්වරක් ජලය ගලා යෑමට සලස්වා සෝදා ගත යුතුය.

36. සතුන්ගේ හම් හොඳින් පදම් කරගත් පසුව,

1. ආහාරය උදෙසා භාවිත කළ හැකිය.
2. සෑම අවශ්‍යතාවයකට ම භාවිත කළ හැකිය.
3. ආහාරයට හැර වෙනත් ඕනෑම අවශ්‍යතාවයකට භාවිත කළ හැකිය.
4. සියල්ලම නිවැරදිය.

37. ක්‍රි.ව 1215දී මහා සම්මුතිය "සුමක්නා කාට්ටා" යන සාර් රජතුමා සහ ජනතාව අතර ගිවිසුමක් ඇති කර ගත්ත ද මානව අයිතිවාසිකම් නිසි ලෙස නොතිබුණු බැවින් එය විවිධ සංශෝධනවලට ලක් කෙරුණි. එය සිදුවුයේ,

1. ශ්‍රී ලංකාවේ
2. ඇමරිකාවේ
3. ප්‍රංශයේ
4. ඉතාලියේ

38. නීතිපතිව සිටි සි. ඩී. වීරමන්ත්‍රී තුමාගේ "ඉස්ලාමිය නීතිය හා ජාත්‍යන්තර දැක්ම" යන ග්‍රන්ථයේ විශේෂතාවය වන්නේ,

1, ඉස්ලාමිය නීති ප්‍රශංසා කර තිබීම
2. ඉස්ලාමිය මානව සම්මුතිය පිළිබඳ ප්‍රශංසා කර තිබීම
3. ඉස්ලාමිය යහගුණාංග පිළිබඳ ප්‍රශංසා කර තිබීම
4. ඉස්ලාමිය නැමදුම් වතාවන්වල මහිමය ප්‍රශංසා කර තිබීම

39. ජමාඅත් සලාතයේදී දීර්ඝ සූරා පාරායනය කළ සහාබිවරයෙකු දෙස බලා "ඔබ ජනයාට පහසු කරන්න. අපහසුතාවයට පත් නොකරන්න. උත්සුක කරන්න. පිළිකුල් සහගත නොකරන්න" යැයි නබි (සල්) තුමා අවවාද කළ සහාබි වන්නේ,

1. මුආද් ඉබිනු ජබල් (රළි) තුමා
2. මුස්අබ් ඉබිනු උමෙර් (රළි) තුමා
3. අබිදුල්ලාහ් බින් උමර් (රළි) තුමා
4. අබු මූසා අල් අස්අරි (රළි) තුමා

40. සොරාගේ අත සිඳලිය යුතුය, යන්න සම්බන්ධ නිවැරදි වැකිය වන්නේ,

1. මැණික් කටුව දක්වා සිඳලිය යුතුය.
2. වස්තුවේ වටිනාකමට වඩා දඩුවම් අධික විය යුතුය.
3. නියඟ කාලවලදී ආහාර සොරා ගැනීම.
4. ප්‍රථම හා දෙවන වැකි නිවැරදි ය.

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது.
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2017
Year End Evaluation

| ශ්‍රේණිය தரம் Grade | විෂයය பாடம் Subject | පත්‍රය வினாத்தாள் Paper | කාලය காலம் Time |
|---|---|---|---|
| 10 | ඉස්ලාම් ධර්මය | II | පැය 02 |

.....

අවධානය යොමු කළ යුතු කරුණු

- පළමු ප්‍රශ්නවලට හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.
- ප්‍රථම ප්‍රශ්නයට ලකුණු 20ක් ද අනෙකුත් ප්‍රශ්නවලට ලකුණු 10ක් ද ලබාදෙනු ලැබේ.

.....

01 කෙටි පිළිතුරු සපයන්න.

i. තර්තිබුන් තිලාවත් - තර්තිබුන් නුසුල් යන්න වෙන් කර දක්වන්න.

ii. මාළන් තහූර් හි වර්ග දෙකක් ලියන්න.

iii. සෙනෙහස දැක්විය යුතු දෙදෙනෙකු නම් කරන්න.

iv. සලාතයේදී අවසාන අත්තහියාත් සඳහා හිඳුම නම් කරන්න.

v. තම කුඩා වියේදී මවගේ වදනට කීකරුව සොර කණ්ඩායමට සත්‍ය පැවසුවේ කවිරුන්ද?

vi. "ඉපැයීම්" ඉස්ලාමීය නැමදුමක් වීමට නම් පිළිපැදිය යුතු ඉස්ලාමීය මගපෙන්වීම් දෙකක් ලියන්න.

vii. යකඩ භාවිතා කොට විශාල බිත්ති හා අමුණු නිර්මාණය කිරීමේ තාක්ෂණික දැනුම ඇත්තෙකු ලෙස සුරතුල් කහ්ෆ්හි සඳහන් රජු කවුද?

viii. ඉප්මා, කියාස් හැර සහය මූලාශ්‍ර දෙකක් ලියන්න.

ix. තාවකාලික මහ්රම් ගණයට අයත් දෙදෙනෙකු නම් කරන්න.

x. "ඔබ පිළිවෙත් සුරකින්නෙකුව සිටින්න. එවිට ඔබ මහා නැමදුම් කරන්නෙකුව සිටියි" යැයි නබි (සල්) තුමා පැවසූ සහාබි කවුරුන්ද?

02. i හිදායත්, රිසාලත් වෙන් කර හඳුන්වන්න.

ii ඉබාදත්හි අරමුණු තුනක් ලියන්න.

iii ඊමාන්ධාරියෙකුගේ අමල් ශ්‍රේෂ්ඨවේ යන්න පහදන්න.

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

03 i. “සලවාත් ඉබ්රාහිමියියත්” සිංහලෙන් ලියන්න.

ii නෆ්ස් හි කොටස් තුනකට ලියා කෙටියෙන් පහදන්න.

iii දන් දීම තුළින් ලබා ගත හැකි ප්‍රයෝජන පහක් ලියන්න.

04 i සුන්නාහ් යන්නෙන් කුමක් වටහා ගත හැකිද?

ii සුන්නාහ්වෙහි වැදගත්කම කරුණු තුනකින් පහදන්න.

iii ඉජ්මාවෙහි වර්ග තුන නම් කර කෙටියෙන් විස්තර කරන්න.

05 i ව්‍යාපාරයක මූලික කරුණු මොනවාද?

ii ඉපයීමෙහි වැදගත්කම කරුණු තුනකින් පහදන්න.

iii. ඉස්ලාමීය අර්ථයෙහි විශේෂතා පහදන්න.

06 i මිනිසාගේ සිතෙහි ඇතිවන මූලික ගැටළු මොනවාද?

ii. වහි හි වර්ග උදාහරණ සමග පහදන්න.

iii උස්මාන් (රළි) තුමාගේ කාලයේ දී අල්කුර්ආනය ගොනු කළ සේවය පහදන්න.

07 මාතෘකා දෙකක් පිළිබඳව කෙටි සටහන් ලියන්න.

i. සිරාවෙහි වැදගත්කම
ii. සිෆතුස් සලාත්
iii. යහගුණාංග
iv. තවිබා

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

“Education is not preparation for life; education is life itself.” — John Dewey




Visit SLGURU.LK to download papers and notes.
SLGURU.LK
For Educational Purpose Only